## සිංහල සාහිත්‍ය රසාස්වාදය - I පත්‍රය

## 11 ශ්‍රේණිය

## ආදර්ශ පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

1. (අ) මධු රජුගේ / පබාවතීගේ පිය රජතුමාගේ

   (ආ) පබාවතිය වෙනුවෙන් කුසරජු විශේෂ කර්මාන්තයෙන් කළ මල්මාල මාලාකාරයා අත යැවූ අවස්ථාව

2. (අ) නන්ද තෙරුන්ගේ

   (ආ) හිතමිත්‍ර වහන්දෑට / හිත මිත්‍ර භික්ෂූන් වහන්සේලාට

3. (අ) ඉයෝනාට / ඉයෝනා පොට පොෆ්ට

   (ආ) ඇන්තන් පවුලොවිච් චෙකෝෆ් / ඇන්තන් චෙකෝෆ්

4. (අ) නරක කාලයට සත්ත්වයාට දුන් කරදර පැමිණෙන විට, කරන ලද පව්වලට විපාක ලබාදී මිස ඒ දුක් කරදර දුරු නොවේ.

   (ආ) I පරවීම / හැකිළෙන

   II මේ ලෝකය

5. මොනිකා රුවන්පතිරණ

   දෙපද අකෘතිය

6.

   i. ''රන් නැවක් මධ්‍ය කොට පිපි වැනි ගිය රත් නෙලුම් වනයක් සේ '' හස්ම ප්‍රච්ඡන්න ජාත වේදයත් සේ (මින් එකක් ලියා ඇතිනම් ලකුණු දෙන්න.)

   ii. මීට පෙරත් මේ ලෙසට ම මොහුට ඇතිවූ කැමැත්තත් / ආශාවත් ඉවත් කළෙමි.

   iii. පෙර භවයකත් නන්ද කුමරුට ඇති වූ ආශාවක් මේ ආකාරයෙන් ම ඊට වැඩියමත් පෙන්වා. උපක්‍රමශීලිව ඉවත් කළ බව පෙන්වීමට

   iv. නන්ද තෙරුන් වහන්සේ

   v. නන්ද තෙරුන් වහන්සේ ශාසනය කෙරෙහි ඇල්මක් ඇතිවීම පිළිබඳව දම්සභා මණ්ඩපයෙහි භික්ෂූන් වහන්සේලා අතර කතා බහට ලක් වෙති. එම කතාවට සවන් යොමු කරන බුදුන් වහන්සේ ඉහත භවයකදීද නන්ද කුමරුට ඇති වූ ආශාවන් අත්හැරවූ බව ප්‍රකාශ කරති. එවිට භික්ෂූන් වහන්සේලා විසින් මෙලොව සිදුවීම් දන්නා බවත් අලුවලින් වැසිගිය ගිනි පුපුරක් මෙන් භවයෙන් වැසුණු එම කතාව නොදන්නා බවත් පවසා එම කතාව දේශනා කිරීමට බුදුන් වහන්සේට ආරාධනා කරයි.

   නැතහොත් -

   i. මද්දුම බණ්ඩාර , විහාරමහා දේවිය / රාසිහ මහසෙන්

   ii. මහසෑය , ජය ශ්‍රී මහා බෝධිය , දළදා වහන්සේ

   iii. සතර අතින් මුහුද නැගි පවුරු සදාලයි
   වෙරළ දිගේ මුතු මතුවී
   යසස උදාවෙයි
   පොළොව පලා මිනි රුවනින්
   ඉසුරු ගලා එයි

   iv. රටවටා ඇති මුහුද ආරක්ෂිත පවුරක් සේ සිටින බව
   උදාහරණ :- සතර අතින් මුහුද නැගි පවුරු සදාලයි
   වෙරළින් වටිනා මුතු ලැබෙන බව පැවසීම
   උදාහරණ :- වෙරළ දිගින් මුතු මතුවී යසස උදාවෙයි

## II පත්‍රය

1.

i. මාර්ගයක විසිතුරු අලංකාරයන් වර්ණනා කරමින් එයින් ජීවන දර්ශනය හෙවත් ජීවන දෘෂ්ටියක් ද ඉස්මතු කිරීම (උදාහරණ ඉදිරිපත් කරන්න.)

ii. ශබ්ද රසය හා අර්ථ රසය ජනනය වන අන්දමට කෙටි වැකි යොදා ගැනීම

මගක් නම්
පියවර මතින්
පියවර තබනා

ව්‍යංග්‍යාර්ථවත් බස් වහර යොද ගැනීම

මෙහිදි කවියා වර්ණනා කරන මග හා ගඟ ඔස්සේ ව්‍යංගාර්ථයෙන් පවසන්නේ අප ගමන් කරන දිවි මග සම්බන්ධවයි.

(උදාහරණ මඟින් පැහැදිලි කරන්න.)

* අර්ථවත් රූපකාලංකාර යොදා ගැනීම

මගක් නම්
පියවර මතින්
පියවර තබා
තැනු <u>මගක් ම යි</u>
අතර මග ලත නොවී
මුවදොර සොයා යන
<u>ගඟක් ම යි</u>

iii. නිසදැස් ආකෘතිය යොදාගැනීම

ඉතා කෙටි යෙදුම් උවද විසල් අරුතත් දෙන ආකාරය උදාහරණ මඟින් පැහැදිලි කරන්න.

iv. රිද්මයකට අනුව වචනය යොදා ගනිමින් (උචිත පද සංඝටනය)

සිය දහස්
කෝවේ හමුවෙනා
මංසන්ධය පසුවන
අතවනා
දහසක් දෙනා

සංකේතාත්මක බස්වහර යොදාගැනීම

මුව දොර සොය යන ගඟක්මය '' යන්නෙන් ජීවිතය අවසානය නැතිනම් නිවන් මඟ දක්වා යන ගමන සංකේතවත් කරමි.

v. මේ ජීවිතය නම් තාවකාලික නවාතැනක් පමණී. අප යන ගමන් මගෙහි විරාමය ලැබීමට සරතැස නිවාලීමට අප තාවකාලිකව ලැගුම් ගන්නෙමු. මෙහිදි අපට ලබාගත හැකි වන්නේ මොහොතක විරාමක් පමණී. අප සියල්ල හැරදා යා යුතු ය. මෙය නතර කළ හැක්කේ සියලු බැඳීම් , ඇලීම් , හැඟීම් අත්හළ විට පමණී. (නිදසුන් දක්වන්න.)

2.

- අර්ථ රසය මෙන්ම ශබ්ද රසය ජනනය වන අන්දමට සංස්කෘතික භාෂාවේ ගැඹුරු වචන යොදාගැනීම
  තවද දසබලධාරී වූ සුරාසුරවරචක්‍රවාරු චූඩාමණිමරීචි සඤ්චය පරිචුම්බිත චරණයුගල ......
- දිගු වැකි මෙන්ම කෙටි වැකි යොදගැනීම
  ඒ අපට ලජ්ජා වන්නේ ය.
  ඒ කුමාරයා හට කුස කුමාරයෝ යැයි නම් තුබූහ
  මදු රජ්ජුරුවෝ වීණා ශබ්දය අසා----

- සංවාදාත්මක භාෂාව යොදා ගැනීම
- බලග , මා කළ දෙයක මම් මගේ දියණියකැයි සිතා පහරක් ගැසීම්.
- අවස්ථා නිරූපණය කරන්නට මෙන්ම පාඨක සිතේ සිතුවම් කිරීමට සාම්ප්‍රදායික උපාය යොදා ගනිමින් මනුෂ්‍ය වූත් මෝ තොමෝ දිව්‍යප්සරාවන් මෙන් ඉතා නොබිනිය. (මීට අමතරව ගැළපෙන වෙනත් උදාහරණ ගෙන විස්තර කළ ඇත්නම් ලකුණු ලබාදෙන්න.)

3. * ලොකු මාමා හෙවත් අබිලිං සිඤ්ඤෝග්ගේ චරිතය

   * කලාකාමී හැකියාවලින් පරිපූර්ණ පුද්ගලයෙකි
   * පරාර්ථකාමී පුද්ගලයෙකි
   * ගැමි සංස්කෘති අගය කිරීම
   * යුතුකම් ඉටුකිරීම
   * සිරිසේනට ආදරය දැක්වීම
   * යහ ගුණාංග මෙන්ම සුළු දුර්ගුණ ද පැවතීම.

   (අවස්ථා සිද්ධි ඇසුරෙන් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.)

4. ''සුභාෂිතය'' කාව්‍ය සමාජයට උපදෙස් ලබාදීමේ අරමුණින් ලියවුණ කෘතියකි. පිරිහි යන සාරධර්ම නැවත ඇති කොට යහපත් සමාජයේ බිහි කිරීම කතුවරයාගේ පරමාර්ථය යි. ඒ සඳහා බොහෝ අවස්ථාවල ස්වභාවික සංසිද්ධි යොදාගැනීම.

   පින් මද පුතුන් සියයක් ලදුවත් නිසරු…………..

   සමාජයට පින් හා ගුණ නොමැති පුතුන් සියයක් ඉපදුනත් ප්‍රයෝජනයක් නැත. පිනැති ගුණැති එක් පුතෙකු මුළු සමාජයට යහපතකි.

   රටක සමජයක නායකයා යහපත් පුද්ගලයෙකු විය යුතු ය. එවැනි නායකයෙකු රටට ම අශිර්වාදයකි. එවැනි නායකයෙකු නිසා රටට සිදුවන යහපත විසතර කරන්නේ ද ස්වාභාවික සංසිද්ධීන් මඟිනි.

   දියනෙත උදාවත සිය කිරණින් මහරු…………..

   සූර්යයා උදාවෙද්දී අඳුර දුරුවන්නා සේ යහපත් රජතුමකු නිසා සමාජයේ දුක් දොම්නස් දුරවන බව කවියා පෙන්වා දෙයි

   සමාජයට සේවය කරද්දි උතුම් ගුණ ඇත්තන් නොයෙක් හිරිහැර විඳීමට සිදුවේවි. එයින් ඔවුහු කම්පාවට පත් නෙවෙති.

   අමිත ගුණ නුවණ යුතු උතුමෝ පබද…………..

   එවැනි අකම්පිත සත්පුරුෂයන්ගේ උදාර ගුණ අවබෝධ කරනුයේ පරිසයේ ස්වාභාවයෙන් හැදෙන සඳුන් ගසක් යොදා ගනිමිනි.

   (මෙවැනි තවත් උදාහරණ මඟින් විස්තර කර ඇත්නම් ලකුණු ලබාදෙන්න.)

5. ඇත් පරපුරේ පැවැත්මට සිදුවන හානිය ඇත් පැටවෙකුගේ මුවෙහි නැගෙන ආකාරයට පද්‍ය නිර්මාණය කර ඇත.

   අන්න අන්න අපේ

   නායකයා අද …………..

ඇත් රංචුවේ නායකයාට මිනිසුන් කරන හානිය ඇත් පැටවා දකින ආකාරයට විස්තර කරයි. නායක ඇතාට පහරදී බැරි තැන වෙඩි තබා ඝාතනය කරයි. මිනිසුන්ගේ මේ ක්‍රියාදාමයන් ඇත් පරපුරේ පැවැත්මට තර්ජනයක් වෙයි.

සතා මරා දැමීමෙන් නොනැවැත්වූ මිනිසුන් මළ සතාගේ ලොම් ගලවා ගැනීම කවියා ඉදිරිපත් කරන්නේ ඉතා සංවේදීව ය. සියුම් උපහාසයන් ද ඇත් පැටවා ලවා එල්ල කරයි.

දුටුවද අච්චේ
බුද සරණෙත් මිදි ………….

වලිගේ ලොම් ගලවා ගන්නේ තමාට එයින් සෙත සැලසෙන බවට ඇති මිත්‍යා මතය නිසාය.
මිනිසුන් ක්‍රියා කුඩා සතුන්ට ද බලපාන ආකාරය මෙසේ දන්වයි.

කිරි උගුරක් බී
ගන්න බැරුව අර
දගලන හැටි
දුටුවද දූකිනේ …………..